බැද්දේගම සිළුඳුලා පුංචි මැණිකෙලා මකුළුවන් අතරට

අලුතෙන් හොයාගත් මකුළු විශේෂ 6ක් හතරකට ලෙනාඩ් වුල්ෆ්ගේ බැද්දේගම චරිත පටබැඳෙයි

පුංචි මැණිකා හා හින්නි හාමි පිළිබඳව මතකය අලුත් වනුයේ මෙරට වෙසෙන ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයෙක් වන සුරේෂ් බෙන්ජමින්ගේ නව සොයා ගැනීමක් සමඟමය. ඒ ඔහු සිය ජීවිතකාලීන අධ්‍යයනය මඟින් සොයාගත් නව මකුළු විශේෂ හය අතරින් හතරෙදනකු බැද්දේගම කෘතියෙහි එන චරිත තුනකගේ නමින් සහ එහි මුල්කෘතියේ කතුවරයා වූ ලෙනාඩ් වුල්ෆ්ගේ නමින් නම් කිරීමත් හේතුවෙනි.

"මේ නම්කළ මකුළු වර්ගත් පොළවේ කොළ යටට වෙලා ඉතාමත් රහසිගත ජීවිතයක් තමා ගත කරන්නේ. හරියට බැද්දේගම ඉන්න මිනිස්සු වගේ. ඒ හින්දා තමා එයාලව මේ චරිතවලට සමාන කළේ. බැද්දේගම ඉන්න මිනිස්සු යැපෙන්නේ කැලයෙන්. කැලයෙන් ලැබෙන දෙයක් අරන් තමා එයාලා ජීවත් වෙන්නේ. කැලයේ ඇතුළේ එයාලට මහා ලොකු අනතුරක් නැහැ. පිටින් එන අයගෙන් තමා අනතුර තියෙන්නේ. හරියට බැද්දේගමේ හේන් කැපෙන කාලයට ඒ මිනිස්සුන්ගේ අස්වැන්න හූරන් කන්න බලාගෙන ගමට වදින ආගන්තුකයෝ වගේ.

මේ සත්තුන්ටත් කැලේ ඇතුළේ අනතුරක් නැහැ. උන් ජීවත්වන කැලේ විනාශ වෙන්නේ බාහිර සාධක නිසා. ගස් කපන එකෙන්. කැලේ අපිරිසුදු වෙන එකෙන්. කාලගුණ දේශගුණ විපරීයාස හින්දා උන්ගේ ජීවිත අනුතුරට ලක්වෙලා. "මහාචාර්ය සුරේෂ් බෙන්ජමින්ගෙන් 'ඉරිදා මව්බිම' මේ පිළිබඳව කළ විමසීමකදී ඔහු පැවසුවේ එවැන්නකි.

'*Pal pimanidea Thorell*' නම් මකුළු පවුල පිළිබඳව ලොවට අනාවරණය වූයේ 1870 වසරේදීය. උන් හිඳිවිතන කලාපයට ආවේණික නිශාචර මකුළු පවුලකි. කොළ රොඩු හෝ ගස්වල පොතු මත මේ පවුලේ මකුළුවන් ජීවත්වන බවට හඳුනාගෙන ඇත. ඔහුගේ මේ අධ්‍යයනයේදී හඳුනාගත් නව මකුළු විශේෂ හය පැල්පිමිණිඩේ පවුලට අයත්ය. උන් අයිතිවිනුයේ *Steriphopus* ගණයටය. ඉන් සිදු දෙනෙක් නම් කර ඇත්තේ බැද්දේගම කෘතිය ඇසුරිනි. '*Steriphopus hinnihamiae sp. nov.* ' යනු එක් විශේෂයකි. ඒ විශේෂය නම් කොට ඇත්තේ බැද්දේගම විසූ හින්නිහාමි සිහිගන්වනු පිණිසය. තවත් මකුළු විශේෂයක් නම් කර ඇත්තේ බැද්දේගම විසූ පුංචි මැණිකා සිහිවනු සඳහාය. '*Steriphopus punchimenikae sp. nov.* යනු ඒ විශේෂයි. අන් විශේෂය නම්කොට ඇත්තේ සිළුඳු නමිනි. ඒ *Palpimanus silindu* ලෙසය. සිළුඳුලාට සිය පන්හිඳ පළුපිත් පණ දුන් ලෙනාඩ් වුල්ෆ් හට ගෞරවය පිණිස එක් විශේෂයෙක් '*Steriphopus woolfi sp. nov.* ලෙස නම් කිරීමට මහාචාර්ය සුරේෂ් බෙන්ජමින් කටයුතු කර ඇත්තේය. *Steriphopus ritigalensis sp. nov.* නම් මකුළු විශේෂය සොයාගෙන ඇත්තේ රිටිගල ප්‍රදේශයෙන් නිසා එය සිහිවනු පිණිස රිටිගල නම්න්ම එය නම්කොට ඇත. හය වැන්නා නම්කොට ඇත්තේ *Steriphopus spiralus* ලෙසය. මේ මකුළු විශේෂයේ ලිංගික අවයව සර්පිලාකාර හැඩයක් ගැනීම හේතුවෙන් මේ නමින් එම විශේෂය නම් කොට ඇත.

මේ නව මකුළු විශේෂ හයම මෙරෙටට ආවේණික මකුළු විශේෂයන්ය. මහාචාර්ය බෙන්ජමින් පවසන පරිදි මේ විශේෂ සියල්ලම සිංහරාජ වනයේ සිට පිදුරුතලාගල දක්වා වූ ඕනෑම ස්වාභාවික වනයකින් හමුවන සතුන්ය. එහෙත් උන් බොහෝ සුලබ නොවේ. මේ සතුන් බැලූ බැල්මටම එකිනෙකා වෙන් කොට හඳුනාගත හැකි සතුන් නොවේ. උන්ගේ වෙනස්කම් සෙවිය යුත්තේ ලිංගික අවයවයෙන් පමණි. ගැහැණු සහ පිරිමි සතුන් එකිනෙකා හා සංසර්ගයේ යෙදීමට නිර්මාණය වී ඇති අවයව එකිනෙක වෙනස් ලක්ෂණවලින් පිහිටියි. මේ සතුන් වෙන්කොට හඳුනාගත හැක්කේ ඒවායින් පමණි. බලලූ බැල්මට වෙනසක් නොපෙනුණද අන්වීක්ෂීය නිරීක්ෂණ තුළින් එහි පැහැදිලි වෙනස්කම් දැකිය හැකි බව මහාචාර්ය බෙන්ජමින් සඳහන් කළේය.

එහි හැඩය, එය පිහිටා ඇති ආකාරය ආදියෙන් මේ මකුළු වර්ග එකිනෙක වෙන්ස් වේ.

මේ සතුන් ස්වාභාවික පරිසරයේ ජීවත් වේ. ගල් යට, දිරාපත් වූ අතු යට උන්ගේ ජීවිත ගත වේ. අනෙක් සතුන්ට මෙන් මේ මකුළුවන්ටද හරිපනය ඇත්තේ මිනිසුන්ගෙනි. එහා විනාශය මේ සතුන්ගේ පැවැත්ම කෙරෙහි දැඩි ලෙස බලපා ඇත. මේ සතුන් සුලබව හමු නොවන නිසාම උන් ජීවත්වන පරිසර කලාප විනාශ වීම උන්ගේ ගහනය වඳ වීමට වුවද හේතු විය හැකිය.

මේ අධ්‍යයනය තුළින් ලෝකයේ මින් පෙර හඳුනාගෙන තිබූ මකුළු ගණ හතරක වර්ගීකරණ යාවත්කාලීන කිරීමට හැකිව තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ලෙව විවිධත්වය තවදුරටත් ඉහළ නංවමින් ලෝකයට හඳුන්වාදුන් නව මකුළු විශේෂ අතරට තවත් හයදෙනකු එක කොට ඇත. මින් පෙර පැල්පිමිණිඩේ ගණයට අයත් මකුළු වර්ග අතරින් ශ්‍රී ලංකාවේ වෙසෙන බව හඳුනාගෙන තිබුණේ එකම එක විශේෂයක් පමණි. ඒ *Steriphopus macleayi* නම් මෙරෙටට ආවේණික මකුළු විශේෂයයි. මේ අධ්‍යයනයන් සමඟ එම ගණයට අයත් මෙරෙටට ආවේණික තවත් මකුළු විශේෂ හයක් අනාවරණය වීය.

මහාචාර්ය
සුරේෂ් බෙන්ජමින්

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පරිණාමය, පරිසර විද්‍යාව සහ ජෛව විවිධත්ව පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධානියා ලෙස සේවය කරන මහාචාර්ය සුරේෂ් පී. බෙන්ජමින් මේ වන විට නව මකුළුවන් විශේෂ 150ක වැඩි ප්‍රමාණයක් ලෝකයට හඳුන්වා දී ඇත. ඔහු මකුළුවන් පිළිබඳව අධ්‍යයනය කිරීමට පටන් ගෙන ඇත්තේ ඉකුත් 2000 වසරේදී පමණය.

"මම මකුළුවෝ අධ්‍යයනය කරන්න පටන් ගත්ත දවසේ ඉඳන් පුළුවන් හැම වෙලේම කැලේට යනවා. නිදර්ශක එකතු කරනවා. එක විශේෂයක මකුළුවෝ හොයන්න කියලා යන්නේ නැහැ. හැම මකුළු වර්ගයක්ම ඉලක්ක කරගෙන තමා අපි වැඩ කරන්නේ. නිදර්ශක එකතු කරගෙන ඇවිත් ඒවා නිදහසේ අධ්‍යයනය කරනවා." මහාචාර්ය සුරේෂ් බෙන්ජමින් පවසන්නේ එවැන්නකි.

ඔහු ලොවට හඳුන්වාදී ඇති මකුළු විශේෂ සිය ගණනක් අතුරින් විශේෂ 105ක් සොයාගෙන ඇත්තේ මෙරටිනි. තවත් විශේෂ කිහිපයක් ඉන්දුනීසියාව, බ්‍රසීලය, මැලේසියාව, ඉන්දියාව, මැඩගස්කරය, ටැන්සානියාව යන රටවලින් සහ ඩොමිනිකන් රාජ්‍යයෙන් ලොවට හඳුන්වාදී ඇත.

ඔහු ප්‍රථම වරට ලොවට නව මකුළුවෙක් හඳුන්වාදී ඇත්තේ 2000 වසරේදීය. ඒ දෙහිවල, අත්තිඩිය ප්‍රදේශයෙනි. ඉන්පසු ගත වූ වසර කිහිපය තිස්සෙම ඔහු වර්ග්වර ලොවට නව මකුළු විශේෂ හඳුන්වා දෙමින් එහි වාර්තා අලුත් කළේය. වරෙක ඔහු සොයාගත් නව මකුළු විශේෂයක් ඔහුගේ බිරිය නමින් නම් කළේය. එමෙන්ම මහාචාර්ය සුරේෂ් බෙන්ජමින්ට ගෞරව පිණිස ඔහු නමින් ඉන්දියාවෙන් මකුළු විශේෂ දෙකක්, ශ්‍රී ලංකාවෙන්, ඉන්දුනීසියාවෙන් හා දකුණු අප්‍රිකාවෙන් එක් විශේෂය බැගින් සොයා ගත් නව මකුළු විශේෂ පහක් නම් කොට තිබේ.

■ **සවනි ශේශාඩි**

සිංහරාජය-පිදුරුතලාගල විශේෂ ප්‍රදේශ වන හැටි

රිටිගල ඇසුරෙන් මතු වන තවත් විශේෂයක්

"මේ මකුළු වර්ගත් පොළවේ කොළ යටට වෙලා ඉතාමත් රහසිගත ජීවිතයක් තමා ගත කරන්නේ. හරියට බැද්දේගම ඉන්න මිනිස්සු වගේ. ඒ හින්දා තමා එයාලව මේ චරිතවලට සමාන කළේ. බැද්දේගම ඉන්න මිනිස්සු යැපෙන්නේ කැලයෙන්. කැලයෙන් ලැබෙන දෙයක් අරන් තමා එයාලා ජීවත් වෙන්නේ. කැලයේ ඇතුළේ එයාලට මහා ලොකු අනතුරක් නැහැ. පිටින් එන අයගෙන් තමා අනතුර තියෙන්නේ. හරියට බැද්දේගමේ හේන් කැපෙන කාලයට ඒ මිනිස්සුන්ගේ අස්වැන්න හූරන් කන්න බලාගෙන ගමට වදින ආගන්තුකයෝ වගේ.

ලිංගික අවයව වෙනස් ලක්ෂණවලින් යුක්තයි

එංගලන්තයේ විල්බෙරි වරායෙන් 1904 වසරේ ඔක්තෝබර් මාසයේ දිනයක නැව් නැඟි බ්‍රිතාන්‍ය ජාතිකයෙක් ඉන් තහි තුනකට පසු ලංකාවට පමණක් විශේෂ වේතනයක් ලැබෙන ලංකා සිවිල් සේවයේ ආධුනිකයෙක් ලෙස සේවයට එක්වන හෙතෙම 1905 වසරේ සිය මුල්ම පත්වීම ලද්දේ ධාතනයටය. ඉන් වසර ගණනාවකට පසු උසස් වීමක් ලද හෙතෙම 1908 අගෝස්තුවේ දෙවැනිදා හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහකාර ඒජන්තවරයා ලෙස වැබ භාර ගත්තේය. එතැන් සිට අවුරුදු 2කුත් මාස 9ක් හම්බන්තොට සේවය කිරීමෙන් අනතුරුව ඔහු සිය ආත්මීය සහකාරිය වූ ඇඩිලින් වර්ජිනියා සමඟ නව ගමකින් යන්නට ලංකාවේ රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්විය.

ඔහු නමින් ලෙනාඩ් වුල්ෆ් නම් මෙරට එකල විසූ ජනතාවට ඉතා සමීප වූ බ්‍රිතාන්‍ය ජාතික සිවිල් නිලධාරියාය. ඒවාහයන් සමඟ මෙරට රාජ්‍ය සේවයට සමුදුන් ඔහු හම්බන්තොට වැසියන්ගේ ජන ජීවිතය සිය පන්හිඳෙන් අපූරුවට සාහිත්‍යවට නැඟීය. ඒ වසර 1913දී ප්‍රකාශයට පත් කළ The village in the Jungle නම් කෘතිය ඔස්සේය.

බලපුළුවන්කාරකම් මඟින් පීඩාවට පත්වූ සිළුඳුලාගේත් ඔහුගේ දියණියන් දෙදෙනාගේත් ජීවිතය වටා ගෙතුණු මේ කතාව 'බැද්දේගම' ලෙසින් සිංහල භාෂාවට නැඟුණේ ඒ. පී. ගුණරත්නගේ කෘතියක් ලෙසිනි. ඒ 1949 වසරේදීය. ඉන් වසර ගණනාවකට පසු පසුගියදා යළිත් බැද්දේගම කෘතියෙහි එන සිළුඳු, අනතුරට ලක්වෙලා. "මහාචාර්ය සුරේෂ් බෙන්ජමින්ගෙන් 'ඉරිදා මව්බිම' මේ පිළිබඳව කළ විමසීමකදී ඔහු පැවසුවේ එවැන්නකි.

'*Pal pimanidea Thorell*' නම් මකුළු පවුල පිළිබඳව ලොවට අනාවරණය වූයේ 1870 වසරේදීය. උන් හිඳිවිතන කලාපයට ආවේණික නිශාචර මකුළු පවුලකි. කොළ රොඩු හෝ ගස්වල පොතු මත මේ පවුලේ මකුළුවන් ජීවත්වන බවට හඳුනාගෙන ඇත. ඔහුගේ මේ අධ්‍යයනයේදී හඳුනාගත් නව මකුළු විශේෂ හය පැල්පිමිණිඩේ පවුලට අයත්ය. උන් අයිතිවිනුයේ *Steriphopus* ගණයටය. ඉන් සිදු දෙනෙක් නම් කර ඇත්තේ බැද්දේගම කෘතිය ඇසුරිනි. '*Steriphopus hinnihamiae sp. nov.* ' යනු එක් විශේෂයකි. ඒ විශේෂය නම් කොට ඇත්තේ බැද්දේගම විසූ හින්නිහාමි සිහිගන්වනු පිණිසය. තවත් මකුළු විශේෂයක් නම් කර ඇත්තේ බැද්දේගම විසූ පුංචි මැණිකා සිහිවනු සඳහාය. '*Steriphopus punchimenikae sp. nov.* යනු ඒ විශේෂයි. අන් විශේෂය නම්කොට ඇත්තේ සිළුඳු නමිනි. ඒ *Palpimanus silindu* ලෙසය. සිළුඳුලාට සිය පන්හිඳ පළුපිත් පණ දුන් ලෙනාඩ් වුල්ෆ් හට ගෞරවය පිණිස එක් විශේෂයෙක් '*Steriphopus woolfi sp. nov.* ලෙස නම් කිරීමට මහාචාර්ය සුරේෂ් බෙන්ජමින් කටයුතු කර ඇත්තේය. *Steriphopus ritigalensis sp. nov.* නම්

කොළඹ 07, රොක්හිල් පෙදෙසේ, අංක 101 හි පිහිටි ජාතික සිළුන් නිවේදන්ලේස් පෙදෙන්ලිය සමාගම විසින් ජා ඇල, මීගමුවගොඩ පාර්ශ්‍ව, 302/11/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.